ඔබ බොහෝ සෙයින් සුජූද් කළ යුතුය. හේතුව සැබැවින්ම ඔබ අල්ලාහ් වෙනුවෙන් සුජූදයක් කළ විට, අල්ලාහ් එමගින් ඔබව තරාතිරමකින් උසස් කරවා එමගින් පාපයක් ඔබෙන් මකා දමනු ඇත

මඃදාන් ඉබ්නු අබී තල්හා අල්-යඃමරී විසින් මෙසේ වාර්තා කරන ලදී: මම අල්ලාහ්ගේ දූතයාණන්ගේ සේවකයකු වූ සව්බාන් තුමාව මුණ ගැසී 'මම යමක් කරන විට ඒ හේතුවෙන්
අල්ලාහ් මා ස්වර්ගයට ඇතුළත් කරන ක්රියාවක් මට දන්වා සිටින්නැ'යි පවසා සිටියෙමි.
'එසේ නැතහොත් අල්ලාහ් වෙත වඩාත් ප්රියමනාප ක්රියාව මට දන්වා සිටින්නැයි' මම පවසා සිටියෙමි. එවිට එතුමා නිහඬව සිටියේය. පසුව නැවතත් ඒ ගැන විමසුවෙමි. එවිට ද හෙතෙම නිහඬව සිටියේය. පසුව තුන්වන වරටත් මම විමසා සිටියෙමි. එවිට එතුමා මෙසේ පැවසීය: 'අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) කළ ප්රකාශයකට මම සවන් දී
ඇත්තෙමි.' එනම්: “ඔබ බොහෝ සෙයින් සුජූද් කළ යුතුය. හේතුව සැබැවින්ම ඔබ අල්ලාහ් වෙනුවෙන් සුජූදයක් කළ විට, අල්ලාහ් එමගින් ඔබව තරාතිරමකින් උසස් කරවා එමගින් පාපයක් ඔබෙන් මකා දමනු ඇත." මඃදාන් තුමා මෙසේ පැවසීය: මම අබූ දර්දා තුමාව ද මුණ ගැසී ඒ ගැන විමසා සිටියෙමි. එවිට එතුමා ද සව්බාන් තුමා මට පවසා සිටි දෑම මට පවසා සිටියේය.
[صحيح] [رواه مسلم]

ස්වර්ගයට පිවිසීමට හේතුවක් වන හෝ අල්ලාහ්ට වඩාත් ප්රියමනාප ක්රියාව කුමක්දැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් විමසන ලදී. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එසේ ප්රශ්න කළ තැනැත්තාට මෙසේ පිළිතුරු දුන්හ: 'සලාතයේ දී වැඩිපුර සුජූදය ගැන සැළකිලිමත් වන්න. අල්ලාහ් වෙනුවෙන් කරන සුජූදයක් වී නම් එමගින් ඔබට තරාතිරමක් උසස් කරන අතර පාපයක් ඔබෙන් ඉවත් කර සමාව දෙනු ඇත.'

http://sunnah.global/hadeeth/si/show/3732